කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර) - 2010
2011 දෙසැම්බර් /2012 ජනවාරි

**BCOM E 2025 – සංවිධාන චර්යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

01. අ. ඉංජිනේරුවරයකුට සංවිධාන චර්යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ආ. සංජානන ක්‍රියාවලිය විස්තර කර සංජානන ක්‍රියාවලිය සඳහා බලපාන සාධක විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. උදාහරණ භාවිතා කරමින් ඒකාකාරී චින්තනය යන්න විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

02. අ. මැෂ්ලෝගේ අවශ්‍යතා ධුරාවලි න්‍යාය සහ මැක්ක්ලෙන්ඩ්ගේ අවශ්‍යතා න්‍යාය සන්සන්දනය කරමින් එහි ඇති සමාන හා අසමානකම් දක්වන්න.

(ලකුණු 06)

ආ. පුද්ගලයන් දිගින් දිගටම අභිප්‍රේරණය කළ හැකිද ? එසේම විශාල ප්‍රයත්නයක් දැරීම හේතුකොටගෙන කාර්යසාධනය පහළ යා හැකිද ? සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ඇ. සේවක අභිප්‍රේරණ මට්ටම නිර්ණය කිරීමේදී වැඩ පරිසරය තුල සිටින පුද්ගලයන්ගේ විවිධතා වැදගත් වේ. ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහිද ? නැද්ද ? සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

03. අ. කළමනාකරුවන් ඔවුන්ගේ පහළ මට්ටමේ සේවකයන් සමඟ කටයුතු කිරීමේදී ඔවුන්ගේ බිග් ෆයිව් පෞරුෂත්ව ගති ලක්ෂණ කෙසේ බලපාන්නේද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ආ. සංවිධාන ව්‍යුහය නිර්ණය කිරීමේදී උපායමාර්ග හා සංවිධාන පරිසරය කෙසේ වැදගත් වන්නේද යන්න ඇගයීම් කරන්න.

(ලකුණු 06)

ඇ. නම්‍යශීලී සංවිධාන ව්‍යුහයක් වැඩ පරිසරය තුල නිර්මාණශීලීත්වය හා නවෝත්පාදන වර්ධනය කරයි.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

04. අ. රැකියා ආතතිය සඳහා බලපානු ලබන හේතු සාධක සුදුසු උදාහරණ භාවිතා කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ. රැකියා ආතතිය ශාරීරික, මානසික හා චර්යාත්මක ප්‍රතිඵල ඇති කරනු ලබයි. ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහිද ? ඔබේ පිළිතුරු සඳහා හේතු දක්වන්න.

(ලකුණු 06)

ඇ. ආතතිය සහ ගැටුම් වලක්වාලීම සඳහා භාවිතා කළ හැකි තනිපුද්ගල හා සංවිධානමය උපාය මාර්ග විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

05. අ. සන්නිවේදන ක්‍රියාවලියෙහි පියවර දක්වමින් ඵලදායි සන්නිවේදනයට බලපානු ලබන තනිපුද්ගල හා සංවිධානමය බාධාවන් විස්තර කරන්න.

(ලකුණු 06)

ආ. විධිමත් හා අවිධිමත් සන්නිවේදන ක්‍රම අධ්‍යයනය කරමින් , කළමනාකරණ ශ්‍රිතයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී සන්නිවේදන ක්‍රමයක අවශ්‍යතාවය දක්වන්න.

(ලකුණු 06)

ඇ. " ආකාර්යක්ෂම සන්නිවේදනයකට හේතුව වන්නේ පණිවිඩය යවනු ලබන්නාගේ වරදවේ." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේහිද ? නැද්ද ? සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

06. පහත දක්වෙන මාතෘකා අතුරින් හතරක් සම්බන්ධයෙන් පමණක් කෙටිසටහන් ලියන්න.

අ. රැකියා තෘප්තිය සහ සේවක නොපැමිණීම

ආ. ප්‍රක්ෂේපණය (Projection)

ඇ. ආතතිය සහ සංවිධානමය කාර්ය සාධනය

ඉ. බලය සහ දේශපාලනය

ඊ. න වාචික සන්නිවේදනය (Non Verbal Communication)

(මුළු ලකුණු 5x4= 20)